**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 21 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයනලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ඉපලෝගම ප්‍රාදේශිය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වත්කම් |
| | | | රු.000 | රු.000 | රු.000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම | 01 | - | - | 236 |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 05 | - | - | 138 |
| | - එම - | 01 | - | 04 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 01 | - | - | 04 |
| | - එම - | 01 | - | 95 | - |
| | - එම - | 01 | 200 | - | - |

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශන වලට සිදු වී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### 1.3.2 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂය රු.692,781 ක් වූ අතර, උපයෝගී ලේඛණ/ වාර්තා අනුව ශේෂය රු.719,648 ක් විය.

### 1.3.3 අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 237 විධිවිධාන අනුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ, ගිවිසුම් ප්‍රකාර ගුණාත්මකව ගබඩාවට ලැබුණු බවත්, ඒවා තොග ලේඛනවල ඇතුලත් කළ බවත් ගබඩා භාර නිලධාරියා විසින් ගෙවීම් වවුචරයේ සහතිකයක් දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ රු.780,030 ක භාණ්ඩ මිලදී ගැනීමේදී එම අවශ්‍යතාවය ඉටු කර නොමැතිව ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,574,294 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,606,191 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | වරිපනම් හා බදු | 469 | 375 | 522 | 88 | 56 | 24 |
| (ආ) | බදු කුලී | 555 | 424 | 133 | 407 | 333 | 126 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 360 | 525 | -- | 410 | 410 | 0 |
| (ඈ) | වෙනත් ආදායම් | 3,400 | 1,232 | 964 | 3,700 | 1,075 | 1,820 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණ දෙකක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.522,526 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් රු.845,570 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 ආදායම් අයකර ගැනීමේ දුර්වලතා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් රණජයපුර නිවාස යෝජනා ක්‍රමය ප්‍රදේශය සඳහා 2010 ජනවාරි 15 දින සිට වරිපනම් බදු පනවා තිබුණි. 2010 ජනවාරි 15 දින ප්‍රකාශිත ගැසට් නිවේදනය අනුව දැන්වීම් පුවරු ආදායම්, වාහන හා සත්ව බදු හා ප්‍රාග්ධන බිම් අගය මත බදු පනවා තිබුණි. විගණිත දිනය වූ 2011 මාර්තු 25 දක්වා පනවා තිබූ යථෝක්ත බදු අය කර ගැනීමට කිසිදු වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි.

### 2.2.5 කඩ කාමර බදු

සභාව සතු කඩ කාමර වලින් 2010 වර්ෂය සඳහා කුලී මුදල් අය කිරීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නියම කල වාර්තා පදනම් නොකර පෙර වර්ෂ පදනම් කරගෙන අය කිරීමෙන් සභාවට රු.325,700 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික | | | | | | |
| පඩිනඩි | 9,086 | 8,774 | 312 | 7,939 | 7,538 | 401 |
| අනෙකුත් | 4,005 | 3,777 | 228 | 3,606 | 3,476 | 130 |
| උප එකතුව | 13,091 | 12,551 | 540 | 11,545 | 11,014 | 531 |
| ප්‍රාග්ධන වියදම | 11,732 | 36,206 | (24,474) | 7,869 | 9,387 | (1,518) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මුළු එකතුව | 24,823 | 48,757 | (23,934) | 19,414 | 20,401 | (987) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතිය | 05 | 11 |
| ප්‍රාථමික | 15 | 12 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 03 |
| එකතුව | 21 | 27 |

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාව ඉක්මවා සේවකයන් 09 දෙනෙකු බඳවා ගෙන සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.1,213,030 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්ක්‍රිය භෞතික සම්පත්

**(අ).** උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2007 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට රු.814,000 ක් වටිනා උපකරණ ලබාදී තිබුණු නමුත් අදාල ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

**(ආ).** ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් කසල අපහරණය සඳහා 2008 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු රු.895,000 ක් වටිනා පවර්ට්‍රැක් ට්‍රැක්ටරය 2010 සැප්තැම්බර් මස සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

**2.5.2 අයවිමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.792,650 ක් විය.

**2.6 ආර්ථික නොවු ගනුදෙනු**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ).** රණජයපුර රණවිරු ගම්මානයේ සතිපොල සහ වැසිකිලි ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් 2009 වර්ෂයේ දී රුපියල් මිලියන 03 ක ණය මුදලක් ලබාගෙන රු.2,954,068 ක් වියදම් දරා අදාල කර්මාන්තවල වැඩ අවසන් කර තිබුණු නමුත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගොඩනැගිලි වසා දමා තිබුණි.

**(ආ).** අදාල ණය මුදල ලබා ගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදල වෙත ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති වාර්තාව අනුව පොල භූමියේ කඩ කාමර 40 ක් ඉදිකර ඒවා කුලියටදී මාසිකව රු.40,000 ක ආදායමක් ලබා ගැනීමටත් ඒ මුදල් වලින් දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය වාරික සහ පොලී ගෙවීමටත් අපේක්ෂා කර තිබුණු නමුත් ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා අදාල ණය වාරික සහ පොලී සභා අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි.

**2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවු වියදම්**

එක 'වර්ෂයක් තුළදී රු: 1000 ඉක්මවා දරණ ලද ආධාර මුදල් සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු: 69,050 ක ආධාර සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.8 අවිධිමත් ගණුදෙණු**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ජේදය ප්‍රකාරව වැඩ සේවා සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේදී අත්තිකාරම් ලෙස ගෙවිය හැක්කේ කොන්ත්‍රාත් වටිනාකමින් උපරිම 20% වුවද එම සීමාව ඉක්මවා රු.300,000 වැඩිපුර ගෙවා තිබුණි.

**2.9 කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභසාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගි සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.10 කොන්ත්‍රාත් පරිපාලනය

### ඉදිකිරීම්

සභාව විසින් පහත සඳහන් ඉදිකිරීම් කර්මාන්ත සඳහා පලාත් ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත් කරන ලද තත්ව පාලන වාර්තා අසමත්වීම නොසලකා රු.3,686,318 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි.

| | ඇස්තමේන්තු මුදල | ගෙවූ මුදල | | තත්ව පාලන වාර්තාව අනුව නිරීක්ෂණය |
|---|---|---|---|---|
| | | රු. | | |
| රණජයපුර රණවිරු ගම්මානයේ වැසිකිලි ගොඩනැගිල්ල ඉදිකිරීම | 1,544,026 | 1,460,666 | | කොන්ක්‍රීට්වල සම්පිණ්ඩන ශක්තිය දුර්වල මට්ටමක පැවතීම. |
| රණජයපුර රණවිරු ගම්මානයේ සතිපොල ගොඩනැගිල්ල ඉදිකිරීම. | 1,972,845 | 1,934,825 | i. | පොලොවේ කොන්ක්‍රීට් තට්ටුව දුර්වල මට්ටමක පැවතීම. |
| | | | ii. | කොන්ක්‍රීට් ඝනකම ප්‍රමාණවත් නොවීම. |
| සේනපුර කොහොඹගස් හන්දිය සිට මාර්ගය | | | | කොන්ක්‍රීට්වල සම්පිණ්ඩනන ශක්තිය |

| | | | |
|---|---|---|---|
| කොන්ක්‍රීට් කිරීම | 340,000 | 290,827 | දුර්වල මට්ටමක පැවතීම. |
| | | ------------ | |
| | | 3,686,318 | |
| | | ======= | |

**2.11 අභ්‍යන්තර විගණනය**

**------------------------**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය